25/07/2010 - රාවය

**බොකුදිරාස්ද? මනසදිරාස්ද?**

එදා පෙරදිග ධාන්‍යාගාරය අද පෙරදිග කසිප්පු ස්කාගාරය බවට පත්ව ඇති බව කියන්නේ කණගාටුවෙනි. එදා සියලු කණකරබරණින් සැරසුනු යුවතියකට කිසිදු උපද්‍රවයකින් තොරව අනුරාධපුරයේ සිට රුහුණු පුරයට තනි පංගලමේ කිසිදු බිය සැකයකින් තොරව යාමට හැකිවූ බව කියැවේ. එහෙත් අද අනුරාධපුරයේ සිට රුහුණු පුරයට තබා එක බස් හෝල්ට් එකක් තනිව පයින් යාම විශ්වාස නැත. ඒ හන්දියක් හන්දියක් ගානේ සිටින කසිප්පු කාරයින් නිසාය.

රටේ සංස්කෘතිය සදාචාරය පිරිහී ඇත්තේ  විවෘත ආර්ථිකය නිසා බව සමහරු පවසති. සමහරු පවසන්නේ අසභ්‍ය චිත්‍රපට, වීඩියෝ ආදිය නිසා බවය. සමහරු ඒ සංචාරක ව්‍යාපාරය නිසා බව පවසති. ඒවාද යම් යම් ආකාරයෙන් හේතුවී ඇති බව ඇත්තකි. එහෙත් අපට පෙනෙන හැටියට අපේ රටේ සංස්කෘතිය වලපල්ලට පත්වීමට, මේ රට සංස්කෘතික නරකාදියක් බවට පත්වීමට, ගම්දොර මිහිපිට අපායන් බවට පත්වීමට ප්‍රධාන හේතුව අන් කිසිවක් නොව මේ කසිප්පු ජාවාරමයි.



කොයි මත්පැනත් නිසා සිහිය වෙනස් වන බව, මඳ සිහිය ඇති වන බව ඇත්තකි. එහෙත් අපට පෙනියන්නේ කසිප්පු නිසා සිහිය විකෘති වන බවය. කසිප්පුවලට “බොකුදිරාස් ” කියා ද බොන අය කියති. ඒ කසිප්පුවලට යූරියා පොහොර ආදිය පදමට යොදන නිසාය. කසිප්පුවලට “ඇතිහිටියා” කියා තවත් ප්‍රදේශයක දී කියනු ලැබේ. ඒ ජීවත්වීමේ ආසාව අත්හැරුණු අය එය පානය කළ යුතුය යන අර්ථයෙනි. ජීවත්වුනා ඇති යන අර්ථයෙනි. මේ සියල්ලෙන් කියැවෙන්නේ කසිප්පු ශරීරයට විෂ සහිත බවය. ඉතා අහිතකර බවය. එහෙත් අපට පෙනී යන්නේ කසිප්පු ශරීරයටත් වඩා මනසට විෂ සහිත බවය. මනස විකෘති කරන බවය. දුබල කරන බවය.

අද රටට ඉතිහාසයක් නැති වෙමින් තිබේ. එහෙත් කසිප්පුවලට ඉතිහාසයක් ඇතිවෙමින් තිබේ. එක් කාලයක් ඇතැම් කසිප්පු වර්ගයකට කීවේ ඩඩ්ලිගේ සුදිය කියාය. මේ සම්බන්ධයෙන් ඇත්තේ අපූරු කතාවකි. එනම් එකල සිටි ඉතා කීර්තිමත් හා ජනප්‍රිය දේශපාලනඥයෙක් ජනතාව අමතා කතා පවත්වන විට උදරය අතගෑම පුරුද්දක් කරගෙන සිටියේය. මේ කාලයේ ම රටේ ප්‍රචලිතව පැවති එක්තරා කසිප්පු වර්ගයක් පානය කළ අය ද එය  පානය කළ පසුව නිරතුරුවම බඩ අතගාන්නට වූහ. ඒ නිසා මේ කසිප්පුවලට ඩඩ්ලිගේ සුදිය යන නම පටබැඳිණි.

ඊට පෙර පැවති තවත් නීතිවිරෝධී කසිප්පු වර්ගයක් හඳුන්වනු ලැබුවේ "මැතිණී" නමිනි. මේ රටේ දේශපාලන භූමියට හදිසියේ අවතීර්ණ වූ ජනාදරයට පත් නායිකාවන් ජනතාව ඇමතුවේ කඳුළු සලමිනි. ඒ නිසා ඒ කසිප්පු වර්ගයට "මැතිණී" කියා නමක් වැටිණි.

මේ කරුණු දෙකෙන්ම පැහැදිලි වන්නේ කසිප්පු මගින් අසාමාන්‍ය මානසික විකෘතිතා ඇතිවන බවය. එයට හේතුව කිසිදු ප්‍රමිතියකින් තොරව අහුවෙන දෙයක් යොදා මේ කසිප්පු නිෂ්පාදනය සිදුවීමයි.

"හිටපන් මචං" යනුවෙන් හැඳින්වුනේ තවත් කසිප්පු වර්ගයකි. මේ කසිප්පු පානය කළ විට පෙනීයන්නේ තමන් ළඟ සිටින තැනැත්තා තමන්ගෙන් සමුගෙන යන්නට යනවාක් මෙනි. ඒ නිසා මේ කසිප්පු පානය කළ තැනැත්තා ඔහුව නතර කරවන්නට හිටපන් මචං යයි කියති. මේවා පානය කළ අය මෙලෙෂ එකිනෙකාට හිටපන් මචං යැයි කියමින් සිටිති. ඒ නිසා මේ කසිප්පු වර්ගයට "හිටපන් මචං" කියා නම වැටිණි.

කසිප්පු මගින් සාමාන්‍ය මත්පැන්වලට වඩා අසාමාන්‍ය මානසික විකෘතිතා ඇති කරන බවට මෙය ද උදාහරණයකි.

අද ගම් රටවලින් වාර්තා වන්නේ ඇදහිය නොහැකි අපරාධයන්ය. විකෘති ක්‍රියාවන්ය. මේ කසිප්පු නිසා සිහිය විකෘති වූවන්ගේ ක්‍රියාවන් නොවේද?

අද ගමට දියුණුවක් නැත්තේ ඇයි? කිසිදු විචාරයකින් අවබෝධයකින මිනිසුන් කටයුතු නොකරන්නේ ඇයි? සුළු දෙයටත් අඬදබර ඇති කරගන්නේ ඇයි? අපට වැටහෙන ආකාරයට කසිප්පු නිසා සිහිය දුර්වල වූ පිරිසක් අද ගම් රටවල වාසය කරති. කසිප්පු හේතුවෙන් සිදුවන මේ මනස විකෘතිවීම එය සිරුර තුළ පවතින කාලයට පමනක් සීමා නොවේ. ඉන් පසුවද පවතී. සැබවින්ම කසිප්පු මගින් බොකු දිරාස් වූ අය පමණක් නොව මොළ ද දිරාස් වූ පිරිසකි.

මෙය ඉතාම භයානක තත්ත්වයකි. සිහි නුවණක් නොමැති තැන කුමන සංස්කාතියක් ද? විකෘති වූ සිහිය ඇත්තන් සිටින රටක සදාචාරය, සංස්කෘතිය රැකගන්නේ කෙසේද? මෙය පෙනෙන තත්ත්වයට වඩා ඉතා භයානක තත්ත්වයකි. මුලින් ද දැක්වූ පරිදි මෙයට හේතුව කිසිදු ප්‍රමිතියකින් තොරව යූරියා හෝ කටුකම්බි හෝ අත්තන ඇට හෝ සූර් වන ඕනෑම දෙයක් යොදා කිසිදු ප්‍රමිතියකින් තොරව කසිප්පු නිෂ්පාදනය කිරීමයි.

ඒ නිසා රට ගැන, සදාචාරය ගැන, සංස්කෘතිය ගැන යම් හෝ කැක්කුමක් ඇත්නම් මේ කසිප්පු උවදුර වහාම තුරන් කිරීමට පියවර ගත යුතුය.

ඩෙංගු මදුරුවා දෂ්ට කරන්නේ සිරුරටය. කසිප්පු මදුරුවා දෂ්ට කරන්නේ මනසටය. විනාශ වන්නේ මනසය. නැතිවන්නේ ජාතියේ අධ්‍යාත්මයය.



මුළු ශ්‍රී ලංකාවම පිස්සන් කොටුවක් වීමට පෙර කසිප්පු කර්මාන්තය මුලිනුපුටා දැමී යුතුමය.


**මිලින්ද මොරගොඩ ජනබලවතනය**

161, තිඹිරිගස්යාය පාර, කොළඹ 5.

වෙබ් අඩවිය: www.milinda.org

විද්‍යුත් තැපෑල: email@milinda.org